# ෆොන්සේකා, ජ වි පෙ හා දහතුන

මෙරට දේශපාලනයේ ප්‍රධාන ඔිපාදූපය හා ප්‍රධාන වැරදි තීරණය නැවතත් සාකච්ඡා මේසයට පැමිණ ඇත. කොටි ත්‍රස්තවාදය හා රටේ දෙමළ බෙදුම්වාදය නන්දිකඩාල් කලපුවේ ගිල්වා අවුරුද්දක් පිරෙන මොහොතෙහි ඊනියා යුද්ධ අපරාධ පිළිබඳ ඔිපාදූපය නැවතත් කරළියට පැමිණෙන්නේ ලෝකයේ ඊනියා ජාත්‍යන්තර සංවිධාන හා එක්සත් නොවන ජාතීන්ගේ සංවිධානය ඇසුරෙනි. මෑත භාගයේ ලෝකයේ කෙරුණු සටන්වලදී හමුදාවක් දැක් වූ ඉහළම විනය ප්‍රදර්ශනය කර ඇත්තේ ලංකා හමුදාවන් ය. ලක්ෂ තුනක පමණ පිරිසක් කොටි සංවිධානයේ කුරිරු හස්තයෙන් මුදා ගෙන ඔවුන් ආරක්ෂිත කඳවුරුවල රඳවා පසුව නිරුපද්‍රිතව තම නිවෙස්වලට යෑමට සැලැස් වූ හමුදාවක් ඇත්නම් ඒ මෙරට යුද හමුදාව ය.

සතිපතා මෙන් ඇෆ්ගනිස්ථානයේ හා වෙනත් රටවල යුද අපරාධ සිදුකරන ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් ලංකාවට එරෙහිව යුද අපරාධ පිළිබඳ අභූත චෝදනාව නගන්නේ එක් පැත්තකින් ජනාධිපතිතුමාට හා ආරක්ෂක ලේකම්තුමාට මරණීය දඬුවම් නියම කිරීමට ය. එහි දී ඔවුහු සරත් ෆොන්සේකාගේ සුදු කොඩි සම්බන්ධ පරස්පර විරෝධී ඔිපාදූපය යොදා ගනිති. ෆොන්සේකා මේ සම්බන්ධයෙන් පසුගිය වසරේ ජුනි මස අම්බලන්ගොඩ ධරාමාශෝක විද්‍යාලයේ දී කරන ලද කතාවෙන් පසු බටහිරයන් ඔහු තම අත් අඬංගුවට ගෙන ඇති බව පැහැදිලි ය. බටහිරයෝ ඔහු ලවා දැන් ආරක්ෂක ලේකම්තුමාට හා මේජර් ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතාට එරෙහිව ඊනියා ජාත්‍යන්තරය පැත්තෙන් සාක්ෂි දෙන්නකු බවට පත්කරගෙන ඔහුට ජීවිතදානය දීමට සූදානම් වෙති. එහෙත් ෆොන්සේකා කියන්නේ තමන් දුටු දෙයක් නොව තුන්වැනි පාර්ශවයක් ඔහුට කියා ඇති දෙයකි. ෆොන්සේකා කියන්නේ කවුදෝ ජනමාධ්‍යවාදියකු ආරක්ෂක ලේකම්තුමා ශවේන්ද්‍ර සිල්වා මහතාට සුදු කොඩි රැගෙන එන්නන්ට වුව ද වෙඩි තබන ලෙස දුරකථනයෙන් දුන් අණක් තමාට ඇසුණු බව ඔහු සමග කී බව ය. මේ සාක්ෂියට උසාවියක දී තත්පර දහයකවත් ආයුෂ නැත. එහෙත් බටහිරයෝ ෆොන්සේකා ලවා කියවන මේ ඔිපාදූපයට මහත් වැදගත් බවක් තම ජනමාධ්‍ය මගින් ලබා දෙති. ආණ්ඩුව කළ යුත්තේ ඔිපාදූපය ඔිපාදූපයක් ලෙස සැලකීමත් ඊනියා ජාත්‍යන්තර සංවිධානවල වාර්තා ෆොන්සේකාට හා සරසවි අවුල් කරමින්, අද ඇමරිකාවට සේවය කරන ජ වි පෙ නායකයන්ට නින්ද යෑමට පෙර කියවීමට සැලැස්වීමත් ය. ජ වි පෙ අද කරන්නේ ඔවුන්ගේ වෘත්තීය සමිති හා නීති විරෝධී අන්තරය මගින් රට අස්ථායී කිරීමට මාන බැලීම ය.

අද කැලණිය සරසවියේ ඇතිවී තිබෙන තත්වය මම හොඳාකාරව ම දනිමි. මා එහි සේවය කරන්නට වී වසර හතකි. ඒ ගෙවී ගිය වසර හතේ හා ඉන් පෙර වසර ගණනාවක ම බැලූ බැල්මට පෙනෙන්නේ විද්‍යා පීඨ සිසුන් හා සමාජයීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ සිසුන් අතර ගැටුම් ඇතිවන බව ය. කඹ ඇදීමක් නිසා හටගත් සිද්ධියක් දුරදිග යෑමෙන් ගැටුම් ඇති වී ය ආදිය ජනමාධ්‍යවලට රසවත් පුවත් විය හැකි නමුත් සිදුවන්නේ වෙනත් ම ක්‍රියාවකි. ගැටුම් සිදුවන්නේ විද්‍යා පීඨ හා විද්‍යා පීඨ නොවන සිසුන් අතර නො වේ. ගැටුම් ඇතිවන්නේ ජ වි පෙරමුණ හා ඒ දේශපාලනයට අවනත නොවන සිසුන් අතර ය. විද්‍යා පීඨයේ හැරෙන්නට අනෙක් පීඨවල බලය ජ වි පෙ සතුවෙයි. එහෙත් විද්‍යා පීඨයෙහි බලය ජ වි පෙ නොවන කණ්ඩායමක් සතුවෙයි. ජ වි පෙට ඒ විඳ දරාගත නො හැකි ය. ප්‍රශ්නයේ මුල එතැන ය. ජ වි පෙ පහර දෙන්නේ තමන්ට බලය ලබා නොදෙන සිසුන්ට මිස විද්‍යා පීඨ සිසුන්ට නො වේ. ඔවුන්ට බලය නැත්තේ විද්‍යා පීඨයේ බැවින් ඔවුහු තමන්ට බලය නැති කණ්ඩායමට පහර දෙන්නේ යැයි නොකියා විද්‍යා නොවන පීඨ ශිෂ්‍යයන් අතර විද්‍යා පීඨයට එරෙහිව වෛරයක් වපුරා එහි අස්වැන්න ලෙස විද්‍යා නොවන පීඨවල බලය ලබාගැනීමට කටයුතු කරති. විද්‍යා පීඨයේ බලය ඊළඟ වසරේ ජ වි පෙට හිමිවුවහොත් ගැටුම් නවතිනු ඇත. ජ වි පෙට බලය ඇති විශ්වවිද්‍යාලවල අනෙක් දේශපාලන මතයකට ඉඩක් නැත. කැලණිය විශ්වවිද්‍යාලයට ජ වි පෙ හැරෙන්නට වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකයකු පැමිණ කතාවක් කරනු මා අසා නැත. මේ තත්වය දිගින් දිගට ම පැවතීමට ඉඩදීම ගැන ගුරුවරයකු හා වැඩිදුරටත් පීඨාධිපතිවරයකු වශයෙන් මම ලජ්ජා වෙමි. විශ්වවිද්‍යාලයේ නැවත අධ්‍යයන කටයුතු ආරම්භ විය යුත්තේ මේ තත්වය නැතිකිරීමට පියවර ගැනීමෙන් පසුව ය.

ෆොන්සේකාට ද  ඇත්තේ ජ වි පෙ නායකයන්ගේ වැනි මනසකි. ඔහු අනෙක් මත නොඉවසන බව ඔහුගේ භාෂා ශෛලියෙන් පෙනී යයි. කලවැද්දා, පාහරයා ආදී වචන පිටුපස සැඟ වී ඇත්තේ ඒ අන් මත නොඉවසන දේශපාලනය ය. යම් අයුරකින් ෆොන්සේකා ජනාධිපති වී නම් මේ රට ලේ විලක් වීමට තිබිණි. කෙසේ වෙතත් ෆොන්සේකා ලබා තිබූ අනියම් කීර්තිය නොවන්නට ජ වි පෙට එකම මන්ත්‍රී ධුරයක්වත් නොලැබීමට තිබිණි. ඒ අරුතින් ජ වි පෙ විසින්

© Prof. Nalin De Silva

ෆොන්සේකා කඩේ යවනු ලැබ ඇත. අද බටහිරයන් ජ වි පෙ - ෆොන්සේකා හවුල යොදාගන්නේ ආණ්ඩුවත් වක්‍ර ව හමුදාවත් අපකීර්තියට ලක්කිරීම ය. එමගින් හමුදාවේ ජයග්‍රහණය ලඝු කර දෙමළ ජාතිවාදී දේශපාලනයට හැකි තරම් ඉඩකඩ සපයා දීම අද බටහිරයන්ගේ අවශ්‍යතාව වෙයි. ඊනියා විමර්ශක කණ්ඩායම් මෙරටට එවීමට බටහිරයන් කැසකවන්නේ, එමගින් ආණ්ඩුව අපකීර්තියට ලක්කර දෙමළ ජාතිවාදයට සටන්කර දිනාගත නොහැකි වූ දේ මෙරට දේශපාලනයේ ප්‍රධානම වරද වූ දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාත්මක කිරීමට ය.

දහතුන්වැනි සංශෝධනය ඉන්දියාවේ අවශ්‍යතාව මත අපට බලයෙන් පටවනු ලැබුවක් වෙයි. ඒ සම්බන්ධ අධිකරණ තීන්දුව ක්‍රියාත්මක කළ ආකාරය පිළිබඳ ප්‍රශ්න වෙයි. ඒ කෙසේ වුවත් එයට ඉතිහාසයක් වෙයි. ඒ නැවත නැවත කීම අවශ්‍ය වන්නේ ඉතිහාසයක් නොමැතිව වර්තමානයක් නොමැති බැවිනි. දෙමළ ජාතිවාදය ආරම්භ වූයේ ලන්දේසීන් දුම්කොළ වගාව සඳහා කෝරමණ්ඩල වෙරළෙන් මෙරටට දෙමළ කුලී කරුවන් ගෙන්වීමෙන් පසුව ය. වෙල්ලාලයෝ කෘෂිකාර්මික කම්කරුවෝ වූහ. ඉංගිරිසිහු මෙරට ඊනියා ලාංකේය ජාතියක් බර්ගර්වරුන්ගේ නායකත්වයෙන් ආරම්භ කිරීමට අනුබල දුන්හ. මේ ජාතියේ නායකත්වය දහනවවැනි සියවස අවසන පොන්නම්බලම් - කුමාරස්වාමි දෙමළ ප්‍රභූ පවුලට හිමිවිය. දෙමළ ප්‍රභූන්ට සිංහල ප්‍රභූන්ට වඩා වරප්‍රසාද හිමිවිය. 1920න් පමණ පසු ප්‍රභූන්ට ලැබුණු සීමිත ඡන්දය සමග ජාතික ව්‍යාපාරය ඔස්සේ සේනානායකවරු ඉදිරියට පැමිණියහ. දෙමළ ප්‍රභූන්ගේ වරප්‍රසාද (මන්ත්‍රී ධුර සංඛ්‍යාව හා වෙනත් ධුර ආදිය) එකිනෙක නැතිවීමට පටන්ගත්තේ ය. එහි කිසිදු වරදක් නො වී ය. එහෙත් ඔවුහු තම වරප්‍රසාද නැතිවීම සමස්ත දෙමළ ජනයාට සිදු වූ අසාධාරණ ලෙස අර්ථකථනය කළ හ. ඉංගිරිසිහු ඔවුන්ට අනුබල දුන්හ. දෙමළ ජාතිවාදය ඊනියා අසාධාරණ, දුක් ගැනවිලි, අභිලාෂ ගැන කතාකළහ. ඉන්පසු ඊනියා අභිලාෂ ගැන ද සන්ධීය හා සහසන්ධීය විසඳුමක් ගැන ද අවසානයේ දී ඊනියා දෙමළ නිජබිමක වෙන ම රාජ්‍යයක් ගැන ද ඉල්ලීම් ඉදිරිපත් කළහ. පොන්නම්බලම් රාමනාදන්ගේ සිට වේලුපිලාලේ ප්‍රභාකරන් දක්වා ඇත්තේ එක ම එක සුසමාදර්ශයක් මත පදනම් වූ දෙමළ ජාතිවාදී දේශපාලනයකි. සුසමාදර්ශය ඊනියා අසාධාරණ, දුක්ගැනවිලි, අභිලාෂ, ව්‍යාජ පැරණි දෙමළ රාජ්‍යය, කිසිදාක නොවූ නිජබිම මත පදනම් විණි. ඒ සිංහලත්වයට මෙරට හිමි තැන අහිමිකිරීම සඳහා ඉංගිරිසින්ගේ අනුග්‍රහයෙන් කරගෙන ගිය දේශපාලනයකි. මේ දේශපාලනයෙහි එක් අවස්ථාවක වෙන ම රාජ්‍යයකට විකල්පයක් ලෙස ඉන්දියාව දහතුන්වැනි සංශෝධනය අප මත පැටවී ය.

නන්දිකඩාල් කලපුවේ දී පරාජය කරනු ලැබුවේ ප්‍රභාකරන් පමණක් නො වේ. කලින් කියන ලද සුසමාදර්ශය ද පරාජය කෙරිණි. ප්‍රභාකරන් ඒ සුසමාදර්ශයෙහි මස්තකයෙහි සිටියේ ය. ඔහු සමග සුසමාදර්ශය ද කලපුවේ ගිලී ගියේ ය. දහතුනට සිංහල ජනතාවගෙන් බහුතරය විරුද්ධ ය. එයට තවත් එකතු කරනු තබා එහි සඳහන් දේ ක්‍රියාත්මක කිරීමට ද විරුද්ධ ය. සිංහලයන් දහතුනට විරුද්ධ ඇයි ද යන ප්‍රශ්නය කිසි දිනෙක නො ඇසිනි. සිංහලයන්ගේ ජාතිවාදය නිසා ඔවුන් විරුද්ධවන්නේ යැයි බටහිර ද ඉන්දියාව ද උපකල්පනය කෙළේ ය. පඬියන් නොව සිංහලයෝ දහතුනට විරුද්ධ වී ප්‍රභාකරන් පරාජය කර දෙමළ ජාතිවාදයට යට නොවී එය පරාජය කරන ලෙස ඉල්ලා සිටියෝ ය. අවසානයේ දී රණවිරුවන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් කොටි සහ කලින් කී සුසමාදර්ශය ද දෙමළ බෙදුම්වාදී දේශපාලනය ද පරාජය කෙරිණි. දැන් බටහිරට, ඉන්දියාවට, සිංහල විරෝධී පඬියන්ට අවශ්‍ය නිසා නැවතත් ආපසු දහතුනට යෑමක් ගැන කතාකළ නො හැකි ය. ඒ කිසිසේත් කළ නො හැකි ය. දහතුන දීමට අවශ්‍ය නම් රණවිරුවන්ගේ ජීවිත පරිත්‍යාග නොකර ඒ කළ හැකිව තිබිණි. රණවිරුවන් ජීවිත පරිත්‍යාගයෙන් කොටි විනාශ කෙළේ ආපසු දහතුනට යෑමට නො වේ. ආපසු දහතුනට යෑම රණවිරුවන්ගේ ජීවිත පූජාව සැහැල්ලුවට ලක්කර ඔවුන්ට නින්දා කිරීමකි. ඒ කිසිසේත් කළ හැකි නො වේ. බටහිරයෝ හා දෙමළ ජාතිවාදීහු කිසි දිනෙක සිංහලයන්ට සවන් නො දුන්හ. ඔවුහු සිංහල මතය ලෙස පුහු පඬියන්ගේ බටහිර දේශපාලන න්‍යායට අනුගත වූ ව්‍යාජ ප්‍රකාශන ප්‍රචලිත කළහ. සිංහල බහුතර මතය ජාතිවාදී හංවඩුව ගසා ඉවත දැමූහ. සිංහලයන් ඒ සියල්ලට ම දැන් පිළිතුරු දී ඇත. ලොව කිසිම තැනක නොකළ අන්දමට රණවිරුවන් දරුණුම ත්‍රස්තවාදීන් පරාජය කර ඇති අතර සිංහලයන් ජනාධිපතිවරණයේ දී හා මැතිවරණයේ දී සිංහල ජාතිකවාදී මතය විජයග්‍රහණය කරවා ඇත. මේ, දහතුනත් පැරදුණු දෙමළ ජාතිවාදී සුසමාදර්ශයත් විසිකර සිංහලයන්ගේ හඬට සවන් දී නව සුසමාදර්ශයක් ඇතිකර ගැනීමට කාලය යි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva